## චූළසුඤ්ඤත සුත්තං

## චූලසුඤ්ඤත සූත්‍රය

එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති පුබ්බාරාමෙ මිගාරමාතුපාසාදෙ. අථ ඛො ආයස්මා ආනන්දො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච.

මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අසල මිගාරමාතු ප්‍රාසාද නම්ලත් පූර්වාරාමයෙහි වැඩ වසන සේක. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි ඵලසමවතින් නැඟී සිටියේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හි ද, එතැනට පැමිණියේ ය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත් පසෙක හුන්නේ ය. එකත් පසෙක හුන්නා වූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැල කෙළේ ය.

එකමිදං භන්තෙ, සමයං භගවා සක්කෙසු විහරති නාගරකං නාම සක්‍යානං නිගමො. තත්ථ මෙ භන්තෙ, භගවතො සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං. සුඤ්ඤතාවිහාරෙනාහං ආනන්ද, එතරහි බහුලං විහරාමීති. කච්චි මෙ තං භන්තෙ, සුස්සුතං සුග්ගහීතං. සුමනසිකතං සූපධාරිතන්ති.

භාග්‍යවතුන් වහන්ස, එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍ය ජනපදයන්හි නාගරක නම් ශාක්‍යයන්ගේ නියම්ගම් යම් තැනෙක්හි ද, එහි වැඩ වාසය කරණ සේක. ස්වාමීනි, එහිදී මවිසින් භාග්‍යවතුන් වහන්සේගෙන් “ආනන්දය, මම දැන් වනාහි සූන්‍යතා විහරණයෙන් බහුලව වාසය කරමි.” යන මෙය අසන ලදී. පිළිගන්නා ලදී. කිමෙක් ද ස්වාමිනි, එය මාවිසින් මනාකොට අසන ලද්දක්ද? මනාකොට ඉගෙන ගන්නා ලද්දක්ද? මනාකොට මෙනෙහි කරන ලද්දක්ද? මනාකොට දරණ ලද්දක්ද?

තග්ඝ තෙ එතං ආනන්ද, සුස්සුතං සුග්ගහීතං. සුමනසිකතං සූපධාරිතං. පුබ්බෙපාහං ආනන්ද, එතරහි පි සුඤ්ඤතාවිහාරෙන බහුලං විහරාමි. සෙය්‍යථාපි ආනන්ද, අයං මිගාරමාතුපාසාදෙ සුඤ්ඤො හත්ථිගවාස්ස-වළවෙන, සුඤ්ඤො ජාතරූපරජතෙන, සුඤ්ඤො ඉත්ථිපුරිසසන්නි-පාතෙන, අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං භික්ඛුසඞ්ඝං පටිච්ච එකත්තං. එවමෙව ඛො ආනන්ද, භික්ඛු අමනසිකරිත්වා ගාමසඤ්ඤං, අමනසිකරිත්වා මනුස්සසඤ්ඤං, අරඤ්ඤසඤ්ඤං පටිච්ච මනසිකරොති එකත්තං. තස්ස අරඤ්ඤසඤ්ඤාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. සො එවං පජානාති: යෙ අස්සු දරථා ගාමසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. යෙ අස්සු දරථා මනුස්සසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. අත්ථි චෙවායං දරථමත්තා යදිදං අරඤ්ඤසඤ්ඤං පටිච්ච එකත්තන්ති, සො සුඤ්ඤමිදං සඤ්ඤාගතං ගාමසඤ්ඤායාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං මනුස්සසඤ්ඤායාති පජානාති. අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං අරඤ්ඤසඤ්ඤං පටිච්ච එකත්තන්ති. ඉති යං හි ඛො තත්ථ න හොති, තෙන තං සුඤ්ඤං සමනුපස්සති. යං පන තත්ථ අවසිට්ඨං හොති තං සන්තමිදං අත්ථීති පජානාති. එවම්පිස්ස එසා ආනන්ද, යථාභුච්චා අවිපල්ලත්ථා පරිසුද්ධා සුඤ්ඤතාවක්කන්ති භවති.

ආනන්දය, නුඹ විසින් මෙය ඒකාන්තයෙන් මනාකොට අසන ලද්දේ ය. මනාකොට ඉගෙන ගන්නා ලද්දේ ය. මනාකොට මෙනෙහි කරන ලද්දේ ය. මනාකොට දරණ ලද්දේ ය. ආනන්දය,

මම පළමුවත් දැනුත් ශූන්‍යතාවිහරණයෙන් බහුල කොට වෙසෙමි. ආනන්දය, යම් පරිදි මේ මුවරමා පහය ඇත් ගව අස් වෙළඹුන්ගෙන් ශූන්‍ය වේ ද, රන්රිදියෙන් ශූන්‍ය වේ ද, ස්ත්‍රීපුරුෂ සන්නිපාතයෙන් ශූන්‍ය වේ ද, (එතෙකුදු වුව) මේ අශූන්‍යතායෙක් ද ඇත. කිමෙක යත්: භික්සඟුන් නිසා වන එකත්වය යි. ආනන්දය, එපරිදි ම මහණ ග්‍රාමසංඥා මෙනෙහි නො කොට මනුෂ්‍යසංඥා මෙනෙහි නො කොට අරණ්‍යසංඥා පිණිස එකත්වයක් මෙනෙහි කෙරේ ද, ඒ මහණහු ගේ අරණ්‍යසංඥායෙහි සිත දිවෙයි. පහදියි. මොනොවට සිටී, බැස ගනී. ඒ මහණ මෙසේ නුවණින් දන්නේ ය: ග්‍රාමසංඥා නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. මනුෂ්‍යසංඥා නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. (එතෙකුදු වුව) මේ දරථමාත්‍රයෙක් ඇත. කිමෙක යත්: අරණ්‍යසංඥා නිසා වන එකත්වය යි. ඒ මහණ ග්‍රාමසංඥාව පිළිබඳ මේ සංඥාගතය ශූන්‍යය යි නුවණින් දන්නේ ය. මනුෂ්‍යසංඥා පිළිබඳ මේ සංඥාගතය ශූන්‍යය යි නුවණින් දන්නේ ය. (එතෙකුදු වුව)

අශූන්‍යතායෙක් ද ඇත. කිමෙක යත්: අරණ්‍යසංඥා නිසා වන එකත්වය යි (කියා ද දන්නේ ය.) මෙසේ එහි යමෙක් නැද්ද, එයින් ඒ ශූන්‍යය යි මොනොවට නුවණින් දනී. යමෙක් එහි ඉතිරි වේ ද, විද්‍යමාන වන එය ඒ මේ අශූන්‍යතාව ඇතැ යි නුවණින් දන්නේ ය. ආනන්දය, මෙසෙයිනුදු ඒ මහණ හට තෙල යථාභූත වූ අවිපර්‍යස්ත වූ පාරිශුද්ධ වූ ශූන්‍යතා-වක්‍රාන්තියෙක් වෙයි.

පුන ච පරං ආනනද, භිකඛු අමනසිකරිතවා මනුසසසඤඤං අමනසිකරිතවා අරඤඤසඤඤං පඨවිසඤඤං පටිචච මනසිකරොති එකතතං. තසස පඨවිසඤඤාය චිතතං පකඛනදති පසීදති සනතිටඨති අධිමුචචති. සෙයයථාපි ආනනද, ආසභචමමං සඞකුසතෙන සුවිහතං විගතවලිකං එවමෙව ඛො ආනනද, භිකඛු යං ඉමිසසා පඨවියා උකකූලවිකූලං නදිවිදුගගං ඛාණුකණටකධානං පබබතවිසමං, තං සබබං අමනසිකරිතවා පඨවිසඤඤං පටිචච මනසිකරොති එකතතං තසස පඨවිසඤඤාය චිතතං පකඛනදති පසීදති සනතිටඨති අධිමුචචති. සො එවං පජානාති: යෙ අසසු දරථා මනුසසසඤඤං පටිචච, තෙධ න සනති. යෙ අසසු දරථා අරඤඤසඤඤං පටිචච, තෙධ න සනති. අතථි චෙවායං දරථමතතා යදිදං පඨවිසඤඤං පටිචච එකතතනති. සො සුඤඤමිදං සඤඤගතං මනුසසසඤඤායාති පජානාති. සුඤඤමිදං සඤඤගතං අරඤඤසඤඤායාති පජානාති. අතථි චෙවිදං අසුඤඤතං යදිදං පඨවිසඤඤං පටිචච එකතතනති. ඉති යං හි ඛො තතථ න හොති තෙන තං සුඤඤං සමනුපසසති. යං පන තතථ අවසිටඨං හොති තං සනතමිදං අතථීති පජානාති. එවමපිසස එසා ආනනද, යථාභුචචා අවිපලලතථා පරිසුදධා සුඤඤතාවකකනති භවති.

තවද ආනන්දය, මහණ මනුෂ්‍යසංඥා සිත්හි නො කොට, අරණ්‍යසංඥා සිත්හි නො කොට, පෘථිවිසංඥා පිණිස එකත්වය සිත්හි කෙරෙයි. ඔහුට පෘථිවිසංඥායෙහි සිත අවතරණ කෙරෙයි. පහදී. මොනොවට පිහිටයි. නිශ්චයට බැසගනී. ආනන්දය, යම් පරිදි ගෙරි සමෙක් සියක්හුලින් මොනොවට හිදුවන ලද්දේ පහවගිය රැළි ඇත්තේ වේ ද, ආනන්දය, එපරිදි ම මහණ මේ පොළොවෙහි යම් උස්පහත් තැන් ඇද්ද, නදීන් හා දුර්ගමස්ථාන ඇද්ද, කණුකටු තැන් ඇද්ද, පර්වතයෙන් විෂම වූ තැන් ඇද්ද, එ හැම සිත්හි නො කොට පෘථිවිසංඥා නිසා එකත්වය මෙනෙහි කෙරේ ද, ඔහුට පෘථිවිසංඥායෙහි සිත බසී. පහදී. මොනොවට පිහිටයි. නිශ්චය කොට ගනී. ඒ මහණ මෙසේ නුවණින් දනී: මනුෂ්‍යසංඥා නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. අරණ්‍යසංඥා නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. වැලිත් මේ දරථමාත්‍රයෙක් ඇත. කිමෙක යත්: පෘථිවිසංඥා නිසා වන එකත්වයයි කියා යි. හේ මනුෂ්‍යසංඥා පිළිබඳ මේ සංඥාගතය ශූන්‍යය යි නුවණින් දනී. අරණ්‍යසංඥා පිළිබඳ මේ සංඥාගතය ශූන්‍යය යි දනී. (එහෙත්) මේ අශූන්‍යතායෙක් ද ඇත. කිමෙක යත්: පෘථිවිසංඥා නිසා වන එකත්වයයි කියාත් දනී. මෙසේ එහි යමෙක් නැද්ද එයින් ඒ ශූන්‍යය යි නුවණින් දකී. එහි යමෙක් ඉතිරි වැ ඇද්ද, විද්‍යමාන වූ එය ඇතැ යි නුවණින් දනී. මෙසෙයිනුදු ආනන්දය, ඔහුට යථාභූත වූ අවිපර්‍යස්ත වූ පරිශුද්ධ වූ තෙල ශූන්‍යතාවක්‍රාන්තිය වෙයි.

පුන ච පරං ආනන්ද, භික්ඛු අමනසිකරිත්වා අරඤ්ඤසඤ්ඤං අමනසිකරිත්වා පඨවිසඤ්ඤං ආකාසානඤ්චායතනසඤ්ඤං පටිච්ච මනසිකරොති එකත්තං. තස්ස ආකාසානඤ්චායතනසඤ්ඤාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. සො එවං පජානාති: යෙ අස්සු දරථා අරඤ්ඤසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. යෙ අස්සු දරථා පඨවිසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. අත්ථි චෙවායං දරථමත්තා යදිදං ආකාසානඤ්චායතනසඤ්ඤං පටිච්ච එකත්තන්ති. සො සුඤ්ඤමිදං සඤ්ඤාගතං අරඤ්ඤසඤ්ඤායාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං පඨවිසඤ්ඤායාති පජානාති. අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං ආකාසානඤ්චායතනසඤ්ඤං පටිච්ච එකත්තන්ති. ඉති යං හි ඛො තත්ථ න හොති තෙන තං සුඤ්ඤං සමනුපස්සති. යං පන තත්ථ අවසිට්ඨං හොති. තං සන්තමිදං අත්ථීති පජානාති. එවම්පිස්ස එසා ආනන්ද, යථාභුච්චා අවිපල්ලත්ථා පරිසුද්ධා සුඤ්ඤතාවක්කන්ති භවති.

තවද ආනන්දය, මහණ අරණ්‍යසංඥා මෙනෙහි නො කොට, පෘථිවිසංඥා මෙනෙහි නො කොට, ආකාසානඤ්චායතනසංඥා පිණිස එකත්වය සිත්හි කෙරෙයි. ආකාසානඤ්චායතනසංඥා පිණිස ඔහුගේ සිත බැසී., පහදී. මොනොවට පිහිටයි. නිශ්චය කොට ගනී. හේ මෙසේ නුවණින් දනී: අරණ්‍යසංඥා නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. පෘථිවිසංඥා නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. (එහෙත්) මේ දරථමාත්‍රයෙක් ඇත. කිමෙක යත්: ආකාසානඤ්චායතනසංඥා නිසා වන එකත්වය කියා යි. හේ අරණ්‍යසංඥා පිළිබඳ මේ සංඥාගතය ශූන්‍යය යි නුවණින් දනී. පෘථිවිසංඥා පිළිබඳ මේ සංඥාගතය ශූන්‍යය යි නුවණින් දනී. එහෙත් මේ අශූන්‍යතායෙක් ද ඇත. කිමෙක යත්: ආකාසානඤ්චායතනසංඥා නිසා වන එකත්වය (කියා ද) දනී. මෙසේ එහි යමෙක් නැද්ද, එයින් ඒ ශූන්‍යය යි නුවණින් දකී. එහි යමෙක් ඉතිරි වැ ඇද්ද, විද්‍යමාන වූ එය ඇති යි නුවණින් දනී. ආනන්දය, මෙසෙයිනුදු ඒ මහණහට යථාභූත වූ අවිපර්‍ය්‍යස්ත වූ පරිශුද්ධ වූ තෙල ශූන්‍යතාවක්‍රාන්ති වෙයි.

පුන ච පරං ආනන්ද, භික්ඛු අමනසිකරිත්වා පඨවිසඤ්ඤං, අමනසිකරිත්වා ආකාසානඤ්චායතනසඤ්ඤං, විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං පටිච්ච මනසිකරොති එකත්තං. තස්ස විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. සො එවං පජානාති: යෙ අස්සු දරථා පඨවිසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. යෙ අස්සු දරථා ආකාසානඤ්චායතනසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. අත්ථි චෙවායං දරථමත්තා යදිදං විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං පටිච්ච එකත්තන්ති. සො සුඤ්ඤමිදං සඤ්ඤාගතං පඨවිසඤ්ඤායාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං ආකාසානඤ්චායතනසඤ්ඤායාති පජානාති. අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං පටිච්ච එකත්තන්ති. ඉති යං හි ඛො තත්ථ න හොති. තෙන තං සුඤ්ඤං සමනුපස්සති. යං පන තත්ථ අවසිට්ඨං හොති. තං සන්තමිදං අත්ථීති පජානාති. එවම්පිස්ස එසා ආනන්ද, යථාභුච්චා අවිපල්ලත්ථා පරිසුද්ධා සුඤ්ඤතාවක්කන්ති භවති.

තවද ආනන්දය, මහණ පෘථිවිසංඥා මෙනෙහි නො කොට, ආකාසානඤ්චායතනසංඥා මෙනෙහි නො කොට, විඤ්ඤාණඤ්චායතනසංඥා නිසා වන එකභාවය මෙනෙහි කෙරෙයි. විඤ්ඤාණඤ්චායතනසංඥායෙහි ඔහු ගේ සිත බසී. පහදී. මොනොවට පිහිටයි. නිශ්චයට යෙයි. හේ මෙසේ නුවණින් දනී: පෘථිවිසංඥා නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. ආකාසානඤ්චායතනසංඥා නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. විඤ්ඤාණඤ්චායතනසංඥා නිසා වන යම් එකීභාවයෙක් වේ ද, මේ දරථ මාත්‍රයෙක් ඇත කියා යි. හේ පෘථිවිසංඥා පිළිබඳ මේ සංඥාගතය ශූන්‍යය යි නුවණින් දනී. ආකාසානඤ්චායතනසංඥා පිළිබඳ මේ සංඥාගතය ශූන්‍යය යි දනී. එහෙත් මේ අශූන්‍යතායෙක් ද ඇත. විඤ්ඤාණඤ්චායතනසංඥා නිසා එකඟභාවයෙක් වේ ද, මේ අශූන්‍යතා ඇති යි දනී. මෙසේ එහි යමෙක් නැද්ද, ඒ ශූන්‍යය යි නුවණින් දකී. එහි යමෙක් ඉතිරි වැ ඇද්ද, විද්‍යමාන වූ එය ඇති යි නුවණින් දනී. ආනන්දය, මෙසෙයිනුදු ඒ මහණහට යථාභූත වූ අවිපර්‍යාස්ත වූ පරිශුද්ධ වූ තෙල ශූන්‍යතාවක්‍රාන්ති වෙයි.

පුන ච පරං ආනන්ද, භික්ඛු අමනසිකරිත්වා ආකාසානඤ්චායතනසඤ්ඤං, අමනසිකරිත්වා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං පටිච්ච මනසිකරොති එකත්තං. තස්ස ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. සො එවං පජානාති: යෙ අස්සු දරථා ආකාසානඤ්චායතනසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. යෙ අස්සු දරථා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. අත්ථි චෙවායං දරථමත්තා යදිදං ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං පටිච්ච එකත්තන්ති. සො සුඤ්ඤමිදං සඤ්ඤාගතං ආකාසානඤ්චායතනසඤ්ඤායාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං විඤ්ඤාණඤ්චායතනසඤ්ඤායාති පජානාති. අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං පටිච්ච එකත්තන්ති. ඉති යං හි ඛො තත්ථ න හොති. තෙන තං සුඤ්ඤං සමනුපස්සති. යං පන තත්ථ අවසිට්ඨං හොති. තං සන්තමිදං අත්ථීති පජානාති. එවම්පිස්ස එසා ආනන්ද, යථාභුච්චා අවිපල්ලත්ථා පරිසුද්ධා සුඤ්ඤතාවක්කන්ති භවති.

තවද ආනන්දය, මහණ ආකාසානඤ්චායතනය සිත්හි නො කොට, විඤ්ඤාණඤ්චායතනය සිත්හි නො කොට, ආකිඤ්චඤ්ඤායතනය නිසා එකභාවය මෙනෙහි කෙරෙයි. ඔහු ගේ සිත ආකිඤ්චඤ්ඤායතනයෙහි බසී. පහදී. මොනොවට පිහිටයි. නිශ්චයට යෙයි. හේ මෙසේ නුවණින් දනී: ආකාසානඤ්චායතනසංඥාව නිසා යම් ද්රථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. විඤ්ඤාණඤ්චායතනසංඥාව නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. එහෙත් මේ දරථමාත්‍රයෙක් ඇත. කිමෙක යත්: ආකිඤ්චඤ්ඤායතනය නිසා වන එකභාවය යි කියා යි. හේ ආකාසානඤ්චායතනසංඥා පිළිබඳ මේ සංඥාගතය ශූන්‍යය යි නුවණින් දනී. විඤ්ඤාණඤ්චායතනසංඥාව පිළිබඳ මේ සංඥාගතය ශූන්‍යය යි නුවණින් දනී. (එතෙකුදු වුව) මේ අශූන්‍යතායෙක් ද ඇත. කිමෙක යත්: ආකිඤ්චඤ්ඤායතනසංඥා නිසා වන එකත්වය වෙති යි නුවණින් දනී. මෙසේ එහි යමෙක් නැද්ද, එය ශූන්‍යය යි නුවණින් දකී. යමෙක් එහි ඉතිරි වැ ඇද්ද, විද්‍යමාන වූ එය ඇති යි නුවණින් දනී. ආනන්දය, මෙසෙයිනුදු ඒ මහණහට යථාභූත වූ අවිපර්‍යස්ත වූ පරිශුද්ධ වූ තෙල ශූන්‍යතාවක්‍රාන්ති වෙයි.

පුන ච පරං ආනන්ද, භික්ඛු අමනසිකරිත්වා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං අමනසිකරිත්වා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤං පටිච්ච මනසිකරොති එකත්තං. තස්ස නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤාය චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. සො එවං පජානාති: යෙ අස්සු දරථා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. යෙ අස්සු දරථා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. අත්ථි චෙවායං දරථමත්තා යදිදං නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤං පටිච්ච එකත්තතන්ති. සො සුඤ්ඤමිදං සඤ්ඤාගතං විඤ්ඤාණඤ්චායතනසඤ්ඤායාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤායාති පජානාති. අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤං පටිච්ච එකත්තතන්ති. ඉති යං හි ඛො තත්ථ න හොති. තෙන තං සුඤ්ඤං සමනුපස්සති. යං පන තත්ථ අවසිට්ඨං හොති, තං සන්තමිදං අත්ථීති පජානාති. එවම්පිස්ස එසා ආනන්ද, යථාභුච්චා අවිපල්ලත්ථා පරිසුද්ධා සුඤ්ඤතාවක්කන්ති භවති.

තවද ආනන්දය, මහණ විඤ්ඤාණඤ්චායතනසංඥා මෙනෙහි නො කොට, ආකිඤ්චඤ්ඤායතනසංඥා මෙනෙහි නො කොට, නෙවසඤ්ඤානාසඤ්ඤායතන සංඥා නිසා එකත්වය මෙනෙහි කෙරෙයි. ඔහු ගේ සිත නෙවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි බැසගෙන සිටී. පහදියි. මොනොවට පිහිටයි. නිශ්චයට යෙයි. හේ මෙසේ නුවණින් දනී: විඤ්ඤාණඤ්චායතනසංඥා නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. ආකිඤ්චඤ්ඤායතනසංඥා නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. වැලිත් මේ දරථමාත්‍රයෙක් ද ඇත. කිමෙක යත්: නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥා නිසා වන එකත්වය වෙති යි දනී. හේ විඤ්ඤාණඤ්චායතනසංඥාව පිළිබඳ මේ සංඥාගතය ශූන්‍යය යි නුවණින් දනී. ආකිඤ්චඤ්ඤායතනසංඥාව පිළිබඳ මේ සංඥාගතය ශූන්‍යය යි දනී. වැලිත් මේ අශූන්‍යත්වයෙක් ද ඇත. කිමෙක යත්: නෙවසඤ්ඤානාසඤ්ඤායතන පිළිබඳ එකත්වය වෙති යි දනී. මෙසේ එහි යමෙක් නැද්ද, එයින් ඒ ශූන්‍යය යි නුවණින් දකී. යමෙක් එහි ඉතිරි වැ ඇද්ද, විද්‍යමාන වූ එය ඇති යි නුවණින් දනී. ආනන්දය, මෙසෙයිනුදු ඒ මහණහට යථාභූත වූ අවිපර්‍යස්ත වූ පරිශුද්ධ වූ තෙල ශූන්‍යතාවක්‍රාන්ති වෙයි.

පුන ච පරං ආනන්ද, භික්ඛු අමනසිකරිත්වා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං අමනසිකරිත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤං අනිමිත්තං චෙතොසමාධිං පටිච්ච මනසිකරොති එකත්තං. තස්ස අනිමිත්තෙ චෙතොසමාධිම්හි චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. සො එවං පජානාති: යෙ අස්සු දරථා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. යෙ අස්සු දරථා නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤං පටිච්ච, තෙධ න සන්ති. අත්ථි චෙවායං දරථමත්තා යදිදං ඉමමෙව කායං පටිච්ච සළායතනිකං ජීවිතපච්චයා'ති. සො සුඤ්ඤමිදං සඤ්ඤාගතං ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤායාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤායාති පජානාති. අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං ඉමමෙව කායං පටිච්ච සළායතනිකං ජීවිතපච්චයාති. ඉති යං හි ඛො තත්ථ න හොති. තෙන තං සුඤ්ඤං සමනුපස්සති. යං පන තත්ථ අවසිට්ඨං හොති, තං සන්තමිදං අත්ථීති පජානාති. එවම්පිස්ස එසා ආනන්ද, යථාභුච්චා අවිපල්ලත්ථා පරිසුද්ධා සුඤ්ඤතාවක්කන්ති භවති.

තවද ආනන්දය, මහණ ආකිඤ්චඤ්ඤායතනසංඥා මෙනෙහි නො කොට, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥා මෙනෙහි නො කොට, අනිමිත්තචෙතොසමාධිය (විදර්ශනාචිත්ත සමාධිය) නිසා එකභාවය මෙනෙහි කෙරෙයි. ඔහු ගේ සිත අනිමිත්තචෙතොසමාධියෙහි බැසගෙන සිටී. පහදියි. මොනොවට පිහිටයි. නිශ්චයට යෙයි. හේ මෙසේ නුවණින් දනියි: ආකිඤ්චඤ්ඤායතනසංඥා නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥා නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මෙහි නැත. වැලිත් මේ දරථමාත්‍රයෙක් ද ඇත. කිමෙක යත්: මේ කය ම නිසා ෂඩායතනප්‍රතිසංයුක්ත වූ ජීවිතයට ප්‍රත්‍යය වූ ප්‍රවෘත්ත දරථමාත්‍රයෙක් ඇති යි දනී. හේ ආකිඤ්චඤ්ඤායතනසංඥා පිළිබඳ මේ සංඥාගතය ශූන්‍යය යි නුවණින් දනී. නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥා පිළිබඳ මේ සංඥාගතය ශූන්‍යය යි නුවණින් දනී. වැලිත් මේ අශූන්‍යතායෙක් ද ඇත. කිමෙක යත්: මේ කය ම නිසා වූ ෂඩායතනප්‍රතිසංයුක්ත වූ ජීවිතප්‍රත්‍යය දරථමාත්‍රයෙක් ඇති යි දනී. මෙසේ යමෙක් එහි නැද්ද, එයින් එය ශූන්‍යය යි නුවණින් දකී. යමෙක් එහි ඉතිරි වැ ඇද්ද, විද්‍යමාන වූ එය ඇති යි නුවණින් දනී. ආනන්දය, මෙසෙයිනුදු ඒ මහණහට යථාභූත වූ අවිපර්‍යාස්ත වූ පරිශුද්ධ වූ තෙල ශූන්‍යතාවක්‍රාන්ති වෙයි.

පුන ච පරං ආනන්ද, භික්ඛු අමනසිකරිත්වා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤං අමනසිකරිත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනසඤ්ඤං අනිමිත්තං චෙතොසමාධිං පටිච්ච මනසිකරොති එකත්තං. තස්ස අනිමිත්තෙ චෙතොසමාධිම්හි චිත්තං පක්ඛන්දති පසීදති සන්තිට්ඨති අධිමුච්චති. සො එවං පජානාති: අයම්පි ඛො අනිමිත්තො චෙතොසමාධි අභිසඞ්ඛතො ආභිසඤ්චෙතසිකො යං ඛො පන අභිසඞ්ඛතං ආභිසඤ්චෙතසිකං, තදනිච්චං නිරොධ-ධම්මන්ති පජානාති. තස්ස එවං ජානතො එවං පස්සතො කාමාසවාපි චිත්තං විමුච්චති. භවාසවාපි චිත්තං විමුච්චති. අවිජ්ජාසවාපි චිත්තං විමුච්චති. විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායාති පජානාති. සො එවං පජානාති: යෙ අස්සු දරථා කාමාසවං පටිච්ච, තෙධ න සන්ති. යෙ අස්සු දරථා භවාසවං පටිච්ච, තෙධ න සන්ති. යෙ අස්සු දරථා අවිජ්ජාසවං පටිච්ච, තෙධ න සන්ති. අත්ථි චෙවායං දරථමත්තා, යදිදං ඉමමෙව කායං පටිච්ච සළායතනිකං ජීවිතපච්චයා'ති. සො සුඤ්ඤමිදං සඤ්ඤාගතං කාමාසවෙනාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං භවාසවෙනාති පජානාති. සුඤ්ඤමිදං සඤ්ඤාගතං අවිජ්ජාසවෙනාති පජානාති. අත්ථි චෙවිදං අසුඤ්ඤතං යදිදං ඉමමෙව කායං පටිච්ච සළායතනිකං ජීවිතපච්චයාති. ඉති යං හි ඛො තත්ථ න හොති. තෙන තං සුඤ්ඤං සමනුපස්සති. යං පන තත්ථ අවසිට්ඨං හොති, තං සන්තමිදං අත්ථීති පජානාති. එවමස්ස එසා ආනන්ද, යථාභුච්චා අවිපල්ලත්ථා පරිසුද්ධා පරමානුත්තරා සුඤ්ඤතාවක්කන්ති භවති.

තවද ආනන්දය, මහණ ආකිඤ්චඤ්ඤායතනසංඥා මෙනෙහි නො කොට, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසංඥා මෙනෙහි නො කොට, අනිමිත්තචෙතො-සමාධිය සඳහා එකත්වයක් මෙනෙහි කෙරෙයි. ඔහු ගේ සිත අනිමිත්ත-චෙතොසමාධියෙහි බසී. පහදී. මොනොවට පිහිටයි. නිශ්චයට යෙයි. හේ මෙසේ නුවණින් දනී: මේ අනිමිත්තචෙතොසමාධිය ද අභිසංස්කෘතය, ආභිසංචෙතසික ය. යම් කිසිවක් අභිසංස්කෘතත් අභිසංචෙතසිකත් වේ නම් ඒ අනිත්‍ය ය. නිරෝධස්වභාව ඇති යි නුවණින් දනී. මෙසේ දන්නා මෙසේ දක්නා ඔහුගේ සිත කාමාස්‍රවයන් කෙරෙනුදු වෙසෙසින් මිදෙයි. භවාස්‍රවයන් කෙරෙනුදු සිත මිදෙයි. අවිද්‍යාස්‍රවයන් කෙරෙනුදු සිත මිදෙයි. විමුක්ත වත් මැ විමුක්ත යැ යන ඥානය වෙයි. ජාතිය ක්ෂීණ ය. බ්‍රහ්මචර්‍ය්‍යය වැස නිමවන ලද, කරණී කරන ලද මේ අර්හත්වය පිණිස මතුයෙහි කිසිදු නැති යි නුවණින් දනී. හේ මෙසේ නුවණින් දනී: කාමාස්‍රව නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මේ ආර්‍ය්‍යමාර්ගඵලයෙහි නැත. භවාස්‍රව නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මේ ආර්‍ය්‍යමාර්ගඵලයෙහි නැත. අවිද්‍යාස්‍රව නිසා යම් දරථ කෙනෙක් ඇද්ද, ඔහු මේ ආර්‍ය්‍යමාර්ගඵලයෙහි නැත. වැලිත් මේ දරථමාත්‍රයෙක් ද ඇති. කිමෙක යත්: මේ කය ම නිසා ෂඩායතනසම්ප්‍රයුක්ත ජීවිතප්‍රත්‍යය වූ දරථමාත්‍රය යි දනී. හේ කාමාස්‍රවයෙන් මේ සංඥාගතය ශූන්‍යය යි දනී. භවාස්‍රවයෙන් මේ සංඥාගතය ශූන්‍යය යි දනී. අවිද්‍යාස්‍රවයෙන් මේ සංඥාගතය ශූන්‍යය යි දනී. වැලිත් මේ අශූන්‍යතායෙක් ද ඇති. කිමෙක යත්: මේ කය ම නිසා ෂඩායතනප්‍රතිසංයුක්ත වූ ජීවිතප්‍රත්‍යය වූ දරථමාත්‍ර සංඛ්‍යාත අශූන්‍යතාය යි දනී. මෙසේ එහි යමෙක් නැද්ද, එයින් ඒ ශූන්‍යය යි නුවණින් දකී. එහි යමෙක් ඉතිරි වැ ඇද්ද, විද්‍යමාන වූ එය ඇති යි දනී. ආනන්දය, මෙසේ ඒ මහණහට යථාභූත වූ අවිපර්‍ය්‍යස්ත වූ නිරුපක්ලෙශ වූ තෙල පරමානුත්තර ශූන්‍යතාවක්‍රාන්ති වේ.

යෙපි හි කෙචි ආනන්ද, අතීතමද්ධානං සමණා වා බ්‍රාහමණා වා පරිසුද්ධං පරමානුත්තරං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරිංසු. සබ්බෙ තෙ ඉමං යෙව පරිසුද්ධං පරමානුත්තරං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරිංසු. යෙපි හි කෙචි ආනන්ද, අනාගතමද්ධානං සමණා වා බ්‍රාහමණා වා පරිසුද්ධං පරමානුත්තරං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරිස්සන්ති. සබ්බෙ තෙ ඉමං යෙව පරිසුද්ධං පරමානුත්තරං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරිස්සන්ති. යෙපි හි කෙචි ආනන්ද, එතරහි සමණා වා බ්‍රාහමණා වා පරිසුද්ධං පරමානුත්තරං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරන්ති. සබ්බෙ තෙ ඉමං යෙව පරිසුද්ධං පරමානුත්තරං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරන්ති. තස්මාතිහ ආනන්ද, පරිසුද්ධං පරමානුත්තරං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරිස්සාමාති. එවං හි වො ආනන්ද, සික්ඛිතබ්බන්ති.

ආනන්දය, අතීත කාලයෙහි යම් මැ ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ නිරුපක්ලේශ පරමානුත්තර ශූන්‍යතාඵලසමාපත්තියට පැමිණ විසූහු ද, ඒ හැම මහණ බමුණෝ පරිශුද්ධ පරමානුත්තර මේ ශූන්‍යතාවට ම පැමිණ විසූහු. ආනන්දය, අනාගත කාලයෙහි යම් මැ ශ්‍රමණ හෝ බ්‍රාහ්මණ කෙනෙක් වෙත් ද, ඔහු පරමානුත්තර පරිශුද්ධ ශූන්‍යතාව උපයා වාස කෙරෙත් ද, එ හැම පරිශුද්ධ පරමානුත්තර මේ ශූන්‍යතාව ම උපයා ගෙන වෙසෙත්. ආනන්දය, දැන් යම් මැ ශ්‍රමණ හෝ බ්‍රාහ්මණ කෙනෙක් පරිශුද්ධ පරමානුත්තර මේ ශූන්‍යතාවට පැමිණ වෙසෙත් ද, එ හැම පරිශුද්ධ පරමානුත්තර මේ ශූන්‍යතාවට මැ පැමිණ වෙසෙති. ආනන්දය, එහෙයින් පරිශුද්ධ පරමානුත්තර ශූන්‍යතාව උපයාගෙන වසම්හ යි ආනන්දය, මෙසේ තොප හික්මෙන්නේ ය.

ඉදමවොච භගවා අත්තමනො ආයස්මා ආනන්දො භගවතො භාසිතං අභිනන්දීති.

භාග්‍යවතුන් වහන්සේ මේ වදාළ සේක. සතුටු සිත් ඇති ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝ බුදුවදන් සතුටින් පිළිගත්හ.